කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015 (පැරණි නිර්දේශය)

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# සිංහල

## චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය SINH E - 1025

පළමුවන කොටසත් දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

## I කොටස

01. (අ). පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

ඉක්බිත්තෙන් එක් දවසක් "නැගෙනහිරි යව මැදුම් ගම්වැස්සෝ සර්වාංගයෙන් ධවල වූ පයැ අං ඇති හිසැ මොල්ලියක් ඇති කාලත්‍රය නො ඉක්මවා හඬන්නා වූ ගොනෙකු එවත් වයි, ඉදින් නො එවනු නම් දහසක් දඩ යැ" යි කියා යැවූහ. ඒ ගම්වැස්සෝ ප්‍රශ්නයෙහි විභාග නො දන්නාහු පණ්ඩිතයන් වහන්සේ විචාළහ. පණ්ඩිතයන් වහන්සේ, "රජ්ජුරුවෝ තොප අතින් හැළි කුකුළෙකු ගෙන්වති" යි වදාළ සේක.

"ඒ කුකුළා වනාහි පයැ පොරකටු ඇති බැවින් පයැ අං ඇත්තේ නම; හිසැ මල් ඇති බැවින් හිසැ මොල්ලියක් ඇත්තේ නම; හ්‍රස්ව, දීර්ඝ, ප්ලුත යන තුන් කාලයට උච්චාරණ ශුද්ධ කොට හඬ නගන හෙයින් කාලත්‍රය නො ඉක්මවා හඬන්නේ නම. ඒ සේ හෙයින්, මෙ බඳු කුකුළෙකු යවව" යි වදාළ සේක. ගම්වැස්සෝ එබඳු කුකුළෙකු යැවූහ.

ලකුණු 10 (6 + 4)

(ආ). පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා සංක්ෂිප්ත රසාස්වාදයක් කරන්න.

ඇ ම තැ න කරන මුනිපුද නරඹන ලෙස ට
තැ න තැ න සැවුල්ගණ පැමිණෙත තුරුසිර ට
දි ලි හෙ න මුනිමැඳුර පහනින් එහි නො සි ට
දි ව ය න අඳුරු මෙන් වවුලන් නිකුත් වි ට

ඇ ද ගෙ  න  සිහිල් මඳනල දියදහර හෙ  ත
වි ල ඟ  න  බියෙන් දිළිනිලුපුල් ඇස්වස  ත
අ සු ව  න  සලෙළුවන් මෙත් පරඟනන් වෙ  ත
හැ කි ළෙ  න  පියුම් ගැබ බමරුන් බැස බැඳෙ  ත

හිම ක ර  සිනිඳු සොමිරැස් රැස් කරනු ව  ට
නිල ඹර  කෙතෙයි ඉසි බිජුවට නිසි ලෙස  ට
එක ව ර  දිලෙන දිගු දළුලන ලෙස රුව  ට
මම් තු ර  පෙනෙයි බබළන තරුවැල ද ත  ට

ම ඳ නල  සබඳ සඳවෙල ගිනිදැල් නො ම  ඳ
වැ ඳ වැඳ  පිපිර හුණු තුරුබිජු මෙන් එස  ඳ
රො ද බැඳ  රොනැර ගෙන යන බමර මුළු වැ  ද
කො ඳ වන  පිපෙන රඟ බල හැම තැන සබ  ඳ

ලකුණු 10 (6 + 4)

## II කොටස

02. "හාස්‍යය හා උපහාසය කුළුගන්වමින් ප්‍රභූ සමාජය දැඩි විවේචනයට ලක් කිරීම උම්මග්ග ජාතක කරුවාගේ මුඛ්‍ය පරමාර්ථයයි." විමසන්න.

03. දියකෙළි වැනුමින් විශද වන හංසකවියාගේ ස්වාධීන වර්ණනා චාතුර්යය පිළිබඳ අගැයීමක් කරන්න.

04. සිංහල ගද්‍ය සාහිත්‍ය ඉතිහාසයෙහි කුරුණෑගල යුගයට හිමිවන්නේ කෙබඳු ස්ථානයක්දැයි සනිදර්ශන ව විභාග කරන්න.

05. ගම්පොළ අවධියෙහි රචිත සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණයන්ගේ විශේෂත්වය පරීක්ෂා කරන්න.

06. විවිධත්වයෙන් සහ විචිත්‍රත්වයෙන් යුතු පද්‍ය නිර්මාණ රැසක් සිංහල සාහිත්‍යයට දායාද කළ කෝට්ටේ යුගය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

## III කොටස

07. භාෂණ සිංහලයේ ශබ්ද මාලාව හා ලේඛන සිංහලයේ අක්ෂර මාලාව පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කරන්න.

08. චාර්ල්ස් ඒ. ෆර්ගියුසන්ගේ භාෂාද්විරූපතා ( Diglossia ) සංකල්පය හඳුන්වා සිංහල භාෂාද්විරූපතාවේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

09. සිංහල භාෂා සමාජයේ දැකිය හැකි ප්‍රාදේශීය උපභාෂා ලක්ෂණ විස්තර කරන්න.

<u>නැතහොත්</u>

භාෂාව සහ සංස්කෘතිය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාව පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> පිළිබඳ සටහන් ලියන්න.

- i ශබ්දෝච්චාරණ ඉන්ද්‍රිය පන්තිය
- ii සිංහල භාෂාවේ අර්ධානුනාසිකාක්ෂර
- iii පරිමිත භාෂා
- iv සිංහල භාෂාවේ ප්‍රාස්තාවික ස්වරූප
- v නිත්‍ය සන්ධි හා අනිත්‍ය සන්ධි

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි).

***************